PMoE
Sabaragamuwa

සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

මගේ අංකය / எனது இல / My Number } ME/E/02/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your Number }
දිනය / திகதி / Date } 2022/03/22

අමාත්‍යාංශ ලේකම් / Secretary } Office – 045 2223015 / Mobile – / Email –
කාර්යාලය / Office } නවනගරය,රත්නපුර. / Newtown, Rathnapura. / Office - 045 2222542 Fax - 045 2228042

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක: සබර/2022/01**

සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක,
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු,
සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකවරු,
සහකාර අධ්‍යක්ෂ/ස්ථානභාර නිලධාරී,මෙනේරිපිටිය/අටුළුගම/හල්පේ/බොරාල පුහුණු මධ්‍යස්ථාන,
සියලුම අංශ ප්‍රධානීන්,අධ්‍යාපන අමාත්‍යාංශය,

**විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිත කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **04/2022** හා **2022.03.08** දිනැති චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විශේෂ අවධානය සඳහා මේ සමඟ යොමු කරමි.

02. ඒ අනුව අදාළ චක්‍රලේඛය මගින් සියලුම රජයේ ආයතන වල විදුලිය හා ඉන්ධන පරිභෝජනය සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇති බැවින්, මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන සියළුම දෙපාර්තමේන්තු/ආයතන/පුහුණු මධ්‍යස්ථාන සඳහා අදාළ වන පරිදි උක්ත චක්‍රලේඛය මගින් ලබා දී ඇති උපදෙස් පිළිපදින ලෙස කාරුණිකව දැනුම් දෙමි.

03. තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2022 හි 05 ඡේදය මගින් දක්වා ඇති කරුණට අදාළව ඔබ ආයතන/දෙපාර්තමේන්තු/පුහුණු මධ්‍යස්ථානවල විදුලි බිල්පත්, ජලබිල්පත් හා දුරකථන බිල්පත් වලින් පසුගිය මාසයට වඩා කොපමණ ප්‍රමාණයක් ඊළඟ මාසයේ ඉතිරිකර තිබේද? යන්න පරීක්ෂා කර බැලීම සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර ඒ සම්බන්ධයෙන් අඛණ්ඩව වාර්තාවක් පවත්වාගෙන යාමේ වගකීම මාණ්ඩලික නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ අදාළ නිලධාරියා වෙත පැවරීමට කටයුතු කල යුතුය.

04. ඒ අනුව රාජ්‍ය නිලධාරීන් ලෙස ඉන්ධන හා විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කිරීමටත්, එමඟින් අනිකුත් පුද්ගලයන්ට ආදර්ශයක් වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2022 මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කරන ලෙසත් මේ සම්බන්ධයෙන් සියළුම නිලධාරීන් දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

**සුජානි ආර්. විජේතුංග**
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර

පිටපත් :

1. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
2. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, සබරගමුව පළාත් සභාව. - කා.දැ.ගැ.ස
3. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, සබරගමුව පළාත් සභාව. - කා.දැ.ගැ.ස